සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම
Second term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර වඩාත් පැරණිතම කෘතිය මින් කුමක් ද?

(1) මහාවංසය (2) දීපවංසය
(3) බෝධි වංසය (4) ථූපවංසය

(02) ගල්වල කොටා ඇති ඉර, හඳ, වටාපොත, හක්ගෙඩිය, වැනි පැරණි සලකුණුවලින් පෙන්වා ඇත්තේ,

(1) ප්‍රාදේශීය මායිම් ය. (2) ප්‍රදානයන් පිළිබඳව ය.
(3) පුරාවිද්‍යාත්මක ස්ථානයන් ය. (4) නීති වර්ගයන් ය.

(03) ග්‍රීක මූලාශ්‍රයක් වන "ඉන්ඩිකා" නැමැති කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) ඇරිස්ටෝටල් ය. (2) ප්ලිනී ය.
(3) මෙගස්තිනිස් ය. (4) ටොලමි ය.

(04) මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ලියවී ඇති ග්‍රන්ථයක් වන්නේ,

(1) නිකාය සංග්‍රහය (2) රාජාවලිය
(3) රාජරත්නාකරය (4) සසදාවතය

(05) පහත සඳහන් පුද්ගලයින් අතුරෙන් ශ්‍රී ලංකාවට නොපැමිණ එහෙත් ලංකාව පිළිබඳ තොරතුරු අසා වාර්තා සැකසූවන් දැක්වෙන පිළිතුර කුමක් ද?

A - ඇරිස්ටෝටල් B - පාහියන් හිමි
C - ප්ලිනි D - ඉබන් බතූතා
E - රොබට් නොක්ස් F - හියුංසියැං

(1) A, B, E (2) E, D, B (3) A, C, B (4) A, C, F

(06) බෙල්ලන්බැඳි පැලැස්ස, බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න යන වාසස්ථාන වැදගත් වන්නේ ඒවා,

(1) ප්‍රාග්ඓතිහාසික යුගයේ මානවයා ජීවත් වූ ගල්ලෙන් පිහිටි ස්ථාන නිසා ය.

(2) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ සොහොන් පිහිටා ඇති ස්ථාන නිසා ය.

(3) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන නිසා ය.

(4) මුල් ඓතිහාසික යුගයේ වාපිගම් පිහිටි ස්ථාන නිසා ය.

(07) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශය වන්නේ,

(1) පහත රට වියළි කලාපයයි.

(2) අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුවය.

(3) තෙත් කලාපයේ මැටි සහිත ප්‍රදේශයයි.

(4) කඳුකර උස් බිම් සහිත ප්‍රදේශයයි.

(08) ශ්‍රී ලංකාවේ යකඩ භාවිතා කළ බවට මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,

(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.

(3) මුල් ඓතිහාසික යුගයේ දී ය. (4) ඓතිහාසික යුගයේ දී ය.

(09) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මහා ශිලා සුසාන පිහිටි ස්ථානවලට උදාහරණ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ඉබ්බන්කටුව හා රංචාමඩම (2) හල්දුම්මුල්ල හා බෙරගල

(3) පාහියන්ගල හා රංචාමඩම (4) ඉබ්බන්කටුව හා ගල් සොහොන් කනත්ත

(10) වංසකථා හා සෙල්ලිපිවල "පට්ටනගාම" යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) වාපි ගම් ය. (2) ජනතාව අතහැර දැමූ ගම් ය.

(3) වරාය ආශ්‍රිත ගම් ය. (4) වෙළෙඳ ගම් ය.

(11) පරුමකවරුන්ට බදු අයකර ගැනීමේ හා දේපළ භුක්ති විඳීමේ අයිතිය පැවති බව පෙන්වන සෙල්ලිපිය කුමක් ද?

(1) කොත්ගල්කන්ද සෙල්ලිපිය (2) යටහලෙන සෙල්ලිපිය

(3) ඇඹුල්අඹේ සෙල්ලිපිය (4) කළුදිය පොකුණ සෙල්ලිපිය

(12) අධ්‍යාපනය ලබාදීම හා ලබාගැනීම පිළිබඳ පැරණි සමාජයේ පැවැති ගෞරවනීයත්වය පෙන්වීමට උදාහරණ සපයන ග්‍රන්ථයක් වන්නේ,

(1) සද්ධර්මරත්නාවලිය (2) සද්ධර්මාලංකාරය

(3) ලෝකෝපකාරය (4) මුවදෙව්දාවත

(13) අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කළ නාමය වන්නේ,

(1) සෙයිලාන් ය. (2) සෙරන්ඩිබ් ය.

(3) තැප්‍රෝබේන් ය. (4) රතු කැට දිවයින ය.

(14) මුල් ඓතිහාසික යුගයේ දී විවිධ වෘත්තිකයන් සහ ඔවුන් විසූ ගම්මාන පහත "අ" සහ "ආ" තීරුවල දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. මැණික් කපන්නන් | A - කසීකාරගාම |
| 2. ගොවියන් | B - කුම්භකාරගාම |
| 3. වළං සාදන්නන් | C - කේවට්ටගාම |
| 4. ධීවරයින් | D - මණිකාරගාම |

(1) DCBA (2) BDCA (3) CBDA (4) DABC

(15) අතීතයේ දි ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය ලෙස වැදගත් වීමට හේතු වූ ප්‍රධානතම කරුණ මින් කුමක් ද?

(1) දකුණු ඉන්දියාවට ආසන්නව පිහිටීම ය.
(2) දූපතක් ලෙස පිහිටීම ය.
(3) පෙර - අපර දෙදිග වෙළෙද මාර්ගයේ මධ්‍යගතව පිහිටීම ය.
(4) රට වටා ස්වභාවික වරායවල් පිහිටීම ය.

(16) කිත්සිරිමෙවන් රජ දවස දන්තධාතූන් වහන්සේ වැඩමවන ලද්දේ කුමන වරායට ද?

(1) මහාතිත්ථ (2) ජම්බුකෝලපට්ටන
(3) ලංකාපටුන (4) ගොඩවාය

(17) නරේශ්වර නමින් තමාව හඳුන්වාගෙන ඇත්තේ කුමන රජතුමා ද?

(1) මහසෙන් රජු ය. (2) I කාශ්‍යප රජු ය.
(3) නිශ්ශංකමල්ල රජු ය. (4) කුටකණ්ණ අභය රජු ය.

(18) පැරණිතම සෙල්ලිපිය "බතගු" යන නාමයෙන් හඳුන්වා ඇති නිලධාරියා පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) භාණ්ඩාගාරික (2) භෝජනශාලා අධිකාරි
(3) නගර පරිපාලක (4) සේනාපති

(19) "කැති අඩ" නමින් හැඳින්වූ බද්ද අය කරන ලද්දේ මින් කවරකින් ද?

(1) වැව්වලිනි (2) ගෙවතුවලිනි (3) කුඹුරුවලිනි (4) හේන්වලිනි

(20) වේගයෙන් හමන සුළං උපයෝගී කර ගනිමින් යපස් උණු කිරීමේ තාක්ෂණය අතීතයේ දී පැවති බවට සාක්ෂි හමුවන්නේ,

(1) අලකොල වැවෙනි (2) බෙරගලනි
(3) සමනල වැවෙනි (4) අලිගලනි

(21) මෙරට පාලනය කරන ලද ප්‍රථම රජු ලෙස සැලකෙන්නේ,

(1) I විජයබාහු රජු ය. (2) පණ්ඩුකාභය රජු ය.
(3) මහසෙන් රජු ය. (4) විජය රජු ය.

(22) අතීත පාලකයින් නිසි කාලයට සීසෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කරන ලද්දේ කුමන හේතුව නිසා ද?

(1) වැසි කාලයේ සීසෑමෙන් පසු සෝදා යාමට ලක්වන නිසා ය.

(2) සියලුදෙනාට සීසෑම කළ යුතු නිසා ය.

(3) රජුට ආදායම තර කර ගැනීමට අවශ්‍ය නිසා ය.

(4) කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට අවශ්‍ය නිසා ය.

(23) අතීතයේ රජුට අයත් ඉඩම්වල වගාකිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හඳුන්වන ලද්දේ,

(1) මතරමජ්බක නමිනි. (2) බොජකපති නමිනි.

(3) දකපති නමිනි. (4) කැති අඩ නමිනි.

(24) අපරාධ නීතිය සම්බන්ධයෙන් අතීත රජවරු දැඩිව කටයුතු කළ බවට පුළුල් විස්තරයක් හමුවන සෙල්ලිපිය කුමක් ද?

(1) බදුලු ටැම් ලිපිය (2) අනුරාධපුර පුවරු ලිපිය

(3) වේවැල්කැටිය සෙල්ලිපිය (4) ගල්පොත ශිලා ලිපිය

(25) අතීත සමාජයේ කිරි පරිභෝජනය පැවති බව පෙන්වාදෙමින් තම දියණියට හරක් බානක් තෑගි කිරීමට අදහස් කරන පියෙකු පිළිබඳ තොරතුරු සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?

(1) සිදත් සඟරාව (2) සද්ධර්මරත්නාවලිය

(3) ලෝකෝපකාරය (4) පූජාවලිය

(26) විසිවතාවක් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යැවූ රජතුමා වන්නේ,

(1) VI වන අග්ගබෝධි රජු ය. (2) I අග්ගබෝධි රජු ය.

(3) I ගජබාහු රජු ය. (4) භාතිකාභය රජු ය.

(27) අතීතයේ දී "උසබ" යන මිනුම භාවිත කරන ලද්දේ,

(1) කාලය මැනීමට ය. (2) බර මැනීමට ය.

(3) අවකාශය මැනීමට ය. (4) දිග දුර මැනීමට ය.

(28) - පැරණි රෝහලක නටඹුන් හමුවීම

- සංකීර්ණ ශල්‍යකර්ම සඳහා භාවිතාකළ මෙවලම් හමුවීම

- මහා පරාක්‍රමබාහු සමයට අයත්වීම

ඉහත තොරතුරුවලට අදාළ ස්ථානය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) ආලාහන පිරිවෙන (2) රිටිගල

(3) වෙස්සගිරිය (4) මිහින්තලය

(29) වැව් බැම්ම බාදනය වීමේ අනතුර වළක්වාලීමට ඉදිකර තිබෙන වාරි නිර්මාණය හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?

(1) සොරොව්ව (2) බිසෝකොටුව

(3) රළපනාව (4) පිටවාන

(30) ක්‍රි. ව. 850 දී ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණි දේශ ගවේශකයා වන්නේ,

(1) ඉබන් බතුතා ය. (2) සුලෙයිමාන් ය.

(3) අල් බලසූරිය ය. (4) ඉබන් ශහ්රියර්

(31) පහත දැක්වෙන පාලකයින් අතුරින් පොළොන්නරු රාජධානියට අයත් වන්නන් දැක්වෙන වරණය කුමක් ද?

A - I විජයබාහු රජ B - වසභ රජ

C - සහාසමල්ල රජ D - වළගම්බා රජ

E - මහා පරාක්‍රමබාහු රජ F - කාවන්තිස්ස රජ

(1) B, D සහ F (2) B, C සහ E (3) A, C සහ E (4) A, B සහ D

(32) පළමුවන පරාක්‍රමබාහු රජතුමා උපන් ස්ථානයේ තැනවූ ස්තූපය හැඳින්වෙන්නේ,

(1) සූතිඝර චෛත්‍යය නමිනි. (2) ජේතවනාරාමය නමිනි.

(3) දෙමළ මහා සෑය නමිනි. (4) අභයගිරිය නමිනි.

(33) අතීතයේ නායක ස්වාමීන් වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කිනම් නමින් ද?

(1) අන්තේවාසික (2) සද්ධිවිහරිය

(3) ථෙර (4) සාමණේර

(34) අනුරාධපුර රාජධානි සමයේ දී අන්තර් ජාතික වෙළෙඳාමේ දී භාවිතාකළ ප්‍රධානම වරාය වූයේ,

(1) ගෝකණ්ණයි. (2) ලංකාපට්ටනයි.

(3) ජම්බුකෝල පට්ටනයි. (4) මහාතිත්ථයි.

(35) පහත සඳහන් "අ" තීරුව සහ "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. මුළු දිවයිනම මධ්‍යගත පාලනයක් යටතට ගැනීම | A - හතරවන උදය රජ |
| 2. රෝමය සමඟ විදේශීය සබඳතා පැවැත්වීම | B - දේවානම්පියතිස්ස රජ |
| 3. දේශීය වෙළෙඳ කටයුතු සඳහා නීති පැනවීම | C - දුටුගැමුණු රජ |
| 4. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම | D - භාතිකාභය රජ |

(1) ACBD (2) BCDA (3) CDAB (4) CBAD

(36) ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ පියාගෙන් තම පුතාට රජකම හිමිවීම සුලභ ලක්ෂණයකි. එසේ රජකම හිමි නොවූ අවස්ථාවක් වන්නේ,

(1) කාවන්තිස්ස රජුගෙන් දුටුගැමුණු කුමරුට

(2) දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස කුමරුට

(3) පණ්ඩුකාභය රජුගෙන් මුටසීව රජුට

(4) වසභ රජුගෙන් වංකනාසිකතිස්ස කුමරුට

(37) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ දී ලක්දිවට පැමිණි දේශාටන සංචාරකයෙකුට කියවන්නට හෝ අසන්නට නොලැබෙන සිද්ධීන් ඇතුළත් පිළිතුර කුමක් ද?

A - වළගම්බා රජ දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

B - නිශ්ශංකමල්ල රජ ගල්පොත ශිලා ලිපිය කරවීම

C - කාලිංග මාඝ රජරට ආක්‍රමණය කිරීම

D - දුටුගැමුණු රජ ලෝවාමහාපාය ඉදිකිරීම

(1) B හා C (2) C හා D (3) A හා D (4) B හා D

(38) අතීතයේ විවිධ ආභරණ සැකසීමේ තාක්ෂණය පිළිබඳ හොඳම උදාහරණය හමුවී ඇත්තේ,

(1) අභයගිරි ගැනීම්වලිනි. (2) ආලාහන පිරිවෙන් කැනීම්වලිනි.

(3) ජේතවන කැනීම්වලිනි. (4) ථූපාරාම කැනීම්වලිනි.

(39) අපේ රටේ පැවති මැටි බඳුන් තාක්ෂණය පිළිබඳ පැරණිතම සාධක හමුවන්නේ,

(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.

(3) මුල් ඓතිහාසික යුගයේ දී ය. (4) ඓතිහාසික යුගයේ දී ය.

(40) දළදා මාළිගයේ ආරක්ෂාව වේලෙයික්කාර හමුදාවට භාර කරන ලද බව සෙල්ලිපිවල සඳහන් රජතුමා වන්නේ,

(1) නිශ්ශංකමල්ල රජු ය. (2) හතරවන කාශ්‍යප රජු ය.

(3) පළමුවන විජයබාහු රජු ය. (4) මහා පරාක්‍රමබාහු රජු ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
**Second term Evaluation** - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: **ඉතිහාසය** | පත්‍රය / வினாத்தாள் / **Paper**: **II** | කාලය / காலம் / **Time**: **පැය 03** |

**සැලකිය යුතුයි:**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) පොළොන්නරුව, කලා ඔය, ගොඩවාය, යෝධ වැව, දේවනගර, සල්වතොට, ජම්බුකෝලපට්ටන, ගම්පොළ, හුරුළු වැව, මහියංගනය, පාහියංගල, අනුරාධපුරය (ලකුණු 12)

(ii) අරාබිය, චීනය, දකුණු ඉන්දියාව, බෙංගාල බොක්ක, කළු මුහුද, රෝමය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මහාවංසයේ මුල් කොටස රචනා කරන ලද භික්ෂූන් වහන්සේ

B - කීර්ති කුමරුට රුහුණේදී ආරක්ෂක වරණය සැපයූ ආරක්ෂක නිලධාරියා

C - හේන් ගොවිතැන සම්බන්ධ බදු වර්ග දෙක අහෝසි කළ පොළොන්නරු පාලකයා

D - මින්නේරිය වැව කරවන ලද රජතුමා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.


A රූපය

(ii) (1) A වලින් දැක්වෙන චිත්‍ර දක්නට ලැබෙන ස්ථානය නම් කරන්න.
(2) මෙය කීවෙනි සියවසට අයත් ද?
(3) කුමන රජතුමා විසින් මෙම නිර්මාණය කර ඇත් ද?
(4) විද්වතුන්ගේ අදහස් අනුව මෙම චිත්‍රවලින් නිරූපිත එක් දෙයක් සඳහන් කරන්න. (ලකුණු 04)


B රූපය

(iii) (1) B වලින් දැක්වෙන නිර්මාණය නම් කරන්න.
(2) මෙම ගොඩනැගිල්ල කිනම් ආගමකට අයත් ද?
(3) මෙය දක්නට ලැබෙන ඓතිහාසික නගරය නම් කරන්න.
(4) මෙය ගොඩනගන ලද්දේ ශ්‍රී ලංකාව යටත් කරගත් කවර විදේශීය පාලකයන් විසින් ද? (ලකුණු 04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ජීවත්වූ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) මුල් ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාල පරිච්ඡේදයක් ද?

(b) සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් එකල තිබූ වාපිගාම තුනකට උදාහරණ දෙන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත්වූ මානවයා තාක්ෂණය භාවිතා කළ ආකාර තුනක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සිද්ධීන් සම්බන්ධ පුද්ගලයින් A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A. ඉන්දියාවේ අශෝක රජතුමා සමග මිත්‍ර සබඳතා ගොඩනගාගත් ශ්‍රී ලාංකික පාලකයා

B. චක්‍රවර්ති යන නමින් තමන්ව හඳුන්වාගත් පාලකයා

C. ලම්බකර්ණ රාජ වංසයේ ප්‍රථම පාලකයා (ලකුණු 03)

(ii) අතීතයේ රජුගේ පාලනයට සහාය වූ ප්‍රධාන නිලධාරීන් හතරදෙනෙක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ගමක නායකයා පත් කිරීමේ දී කටයුතු කළ ආකාරය හා ගමිකගේ කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දුටුගැමුණු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) අතීත ජනතාවගේ පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට කටයුතු කළ නායකයින් තිදෙනෙක් ලියන්න. (ලකුණු 03)

(ii) I විජයබාහු රජතුමා විවාහ සම්බන්ධතා ගොඩනගාගත් දකුණු ඉන්දීය රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ කාර්යයන් දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත කාලයේ අප රටේ ජීවත්වූ විවිධ ජතීන් එකිනෙකා සමග කලකෝලාහල කර ගැනීමට උත්සාහ දරා නැති බව උදාහරණ තුනක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පහත සඳහන් වැව් සෑදූ රජවරු A, B, C අනුපිළිවෙලින් නම් කරන්න.

A. හුරුළු වැව B. කලා වැව C. පදවි වැව (ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති වැවක අංගවලින් කෙරෙන කාර්යය එක බැගින් පිළිවෙලින් ලියා දක්වන්න.

A - වැව් බැම්ම B - සොරොව්ව

C - බිසෝ කොටුව D - පිටවාන (ලකුණු 04)

(iii) අපේ රටේ සිටි පැරණි වාස්තු විද්‍යාත්මක ශිල්පීන් තුළ ඉතා දියුණු විද්‍යාත්මක දැනුමක් තිබූ බවට උදාහරණ දෙකක්වත් දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) විධිමත් ලෙස සැලසුම් කළ ආකෘතියකට නගර නිර්මාණය කිරීම හා උද්‍යාන නිර්මාණය කිරීමේ දී අපේ මුතුන් මිත්තන් ඉතා දක්ෂ බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) ඇළහැර ඇළ මගින් ජලය සපයනු ලැබූ වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා එහි බිත්ති ආවරණය කර ඇති ළිං හඳුන්වන්නේ

B. ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධ කටයුතු කළ නිලධාරියා

C. ඇළහැර අමුණ ඉදිකිරීම සඳහා හරස් කරන ලද ගංගාව

D. ගවයින්ගේ ආරක්ෂාව සඳහා කරන ලද යාතුකර්මයක් (ලකුණු 04)

(iii) ස්වභාව ධර්මයට අයත් භෞතික තත්ත්ව මැන ගැනීමට සමත් ක්‍රමවේදයක් අතීතයේ පැවති බවට අදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත පාලකයන් මහ වැව් ඉදි කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) සෙල්ලිපිවල පහත නම්වලින් හඳුන්වා ඇත්තේ කවුරුන්දැයි A, B, C අනුපිළිවෙලින් ලියන්න.

A. කුඩීන් B. මේ කාප්පර් C. වාපර (ලකුණු 03)

(ii) අතීතයේ වැව් පරිපාලනය සහ රජයේ ඉඩම් පරිහරණය කිරීම සම්බන්ධ රජයට ගෙවිය යුතු බදු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) (a) අතීත සමාජයේ වෙළෙඳාම සම්බන්ධ නීති ඇතුළත් ප්‍රධාන මූලාශ්‍රය නම් කරන්න.

(b) එහි සඳහන් නීති තුනක් ලියන්න. (ලකුණු 05)

(iv) ඉතා පුරාණ කාලකයක සිට මෙරට ජනයා දේශීයව වැවෙන ආහාර පරිභෝජනයට ගත් බව ප්‍රධාන ආහාර වර්ග තුනක්වත් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා

